# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/16 – 2018 අගෝස්තු 14 වැනි අඟහරුවාදා – 2018.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 523, කුඹල්අංග, අංක 524, නෑඹිලිකුඹුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කුඹල් අංග, කෝන්ගහගෙදර ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයු/අයිබීබී/2017/085 හා 2017.03.22 දිනැති පුගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක 13 – මිදැල්ල යාය – ප්‍රමාණය: හෙක්. 0.0315

උතුරට: කැබලි අංක 12 සහ 14; නැගෙනහිරට: කැබලි අංක 14 සහ 29; දකුණට: කැබලි අංක 29; බටහිරට: බී. ඒ. විමලාවතී හිමිකම් කියන මිදැල්ල යාය කුඹුර සහ කැබලි අංක 12.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2016/එච්ඩබ්ලිව්/388.
2018 ජූලි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 1027


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*